# ප්‍රධාන කරුණු ලේඛනය

## ණය පහසුකම්

vallibel Finance

vallibel Finance

වැලිබල් ෆිනෑන්ස් අප, අපගේ ගනුදෙනුකරුවන් සඳහා පුළුල් වූ පරාසයක ණය සේවා රැසක් හඳුන්වා දෙන්නෙමු . සමාගමේ ප්‍රධාන ණය සේවාවන් වන්නේ කල්බදු, උකස් ණය, ඕටෝ ඩ්‍රාෆ්ට්, වාහන ණය සහ රන් ණය යනාදියයි.

| ණය සේවාව | විස්තරය | ප්‍රධාන ලක්ෂණ, නියමයන් හා කොන්දේසි |
|---|---|---|
| **කල්බදු පහසුකම්**<br><br>Vallibel ලීසිං Leasing | ▪ ඔබගේම අවශ්‍යතාවන්ට අනුව සැකසූ මූල්‍ය කල්බදු පහසුකමක් ඔබට වැලිබල් ෆිනෑන්ස් වෙතින් ලබා ගත හැකිය.<br><br>▪ ක්ෂුද්‍ර කල්බදු සහ සාමාන්‍ය කල්බදු ලෙස අප කල්බදු වර්ග දෙකක් හඳුන්වා දෙන්නෙමු.<br><br>▪ අඩු ආයෝජනයකින් යුතු වාහන සඳහා ක්ෂුද්‍ර කල්බදු පහසුකම් ලබා දෙන අතර මේ මගින් ගනුදෙනුකරුවන්ට ලියාපදිංචි කල හා නොකල යතුරුපැදි සහ ත්‍රිරෝද රථ සඳහා කල්බදු පහසුකම් ඔවුන් වෙනුවෙන්ම සකස් කල ආපසු ගෙවීමේ සැලසුම් සහ තරඟකාරී පොළී අනුපාත යටතේ ලබාගත හැකිය.<br><br>▪ පුද්ගලික හා වාණිජමය භාවිතය සඳහා ලියාපදිංචි සහ ලියාපදිංචි නොකළ වාහන මිලදී ගැනීම අවශ්‍යතා ඇති මධ්‍යම හා ඉහළ ආදායම්ලාභීන් හට සාමාන්‍ය කල්බදු පහසුකම් ලබාගත හැකිය.<br><br>▪ තනි පුද්ගල, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ආයතනික ගනුදෙනුකරුවන් හට කල්බදු පහසුකම් ලබාගත හැකිය.<br><br>▪ ලියාපදිංචි සහ ලියාපදිංචි නොකළ මෝටර් කාර්, SUV රථ, වෑන්, වාණිජ වාහන, බස්, ත්‍රිරෝද රථ, තනි කැබ්, සැහැල්ලු ට්‍රක්, ඉඩම් වාහන සහ මෝටර් බයිසිකල්, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණ යනාදී පුළුල් පරාසයක වාහන සහ යන්ත්‍රෝපකරණ සඳහා කල්බදු පහසුකම් ලබාදෙනු ලැබේ. | ▪ වලංගු ජාතික හැඳුනුම්පතක් / විදේශ ගමන් බලපත්‍රයක් හිමි වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින පුද්ගලයෙක් හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ආයතනයක් යන දෙපාර්ශවයම තම ගෙවීමේ හැකියාව මත ලීසිං පහසුකමක් සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබයි.<br><br>▪ අවම කාලසීමාව වසරකට සීමාවන අතර උපරිම කාලසීමාව මාස 72 (වසර 6) ක් දක්වා ලබා දේ.<br><br>▪ කල්බදු පහසුකම් සඳහා සුරැකුම් ලෙස දේපල පිළිබඳ පූර්ණ අයිතිය සහ පුද්ගලික ඇපකරුවන් (අවශ්‍ය නම්) අදාල වේ.<br><br>▪ වාහනය/උපකරණ ධාවන/ක්‍රියාකාරී තත්ත්වයෙන් නඩත්තු කර පවත්වා ගැනීම පාරිභෝගිකයාගේ වගකීමකි.<br><br>▪ අදාල පහසුකම් කාලය පුරාවටම වැලිබල් ෆිනෑන්ස් වෙත මූල්‍ය හිමිකම පවරන ලද පූර්ණ රක්ෂණ ආවරණයක් වාර්ෂිකව ලබා ගත යුතුය.<br><br>▪ ණය පහසුකම් සඳහා අදාළ වන පොළී අනුපාත තීරණය කරනු ලබන්නේ ණය පහසුකමේ ස්වභාවය, කාල සීමාව, ලබා දී ඇති සුරැකුම, සේවාදායකයාගේ මූල්‍ය ස්ථාවරභාවය සහ වෙළඳපල තත්වයන් යනාදිය සැලකිල්ලට ගැනීමෙනි. සේවාදායකයාගේ ණය අවදානම මත ණය පහසුකමේ කාල සීමාව තුල ස්ථාවර හෝ විචල්‍ය පොළී අනුපාතය අය කෙරේ. දැනට එය වසරකට 21%-23% දක්වා පරාසයක පවතී. පවතින අදාළ පොළී ගාස්තුව, පහසුකම සලකා බැලීමට පෙර සේවාදායකයාට මුලදී දැනුම් දෙනු ලැබේ. |

vallibel Finance

| | | |
|---|---|---|
| | | ▪ ණය තොරතුරු කාර්යාංශ ගාස්තු - රු. 1,000/ සිට 3,000/- දක්වා, මුද්දර ගාස්තු (මුද්දර ගාස්තු පනතට අනුව), මෝටර් රථ ලියාපදිංචි ගාස්තු - රු. 2,000/- සිට 2,500/- දක්වා, ලේඛන ගාස්තු, රක්ෂණ වාරික, අදාළ රජයේ බදු (අදාළ නම්), තක්සේරු ගාස්තු (අදාළ නම්) සහ වෙනත් අදාළ ගාස්තු ණය පහසුකම් සාකච්ඡා කරන අවස්ථාවේ දී සමාගම විසින් නිශ්චිතව ප්‍රකාශ කරනු ලැබේ. සියලුම ගාස්තු ණය ගැණුම්කරු විසින් දරනු ලැබේ.<br><br>▪ සමාන වාරික, කලින් එකඟ වූ සැලසුමකට අනුව ව්‍යුහගත හෝ කාලීනව වෙනස් වන නම්‍යශීලී ආපසු ගෙවීමේ විකල්පයන් අප ලබා දෙන්නෙමු.<br><br>▪ කල්බදු ගිවිසුමට ඇතුළත් වීමට පෙර මාසික වාරික මුදල සහ වෙනත් ගාස්තු පිළිබඳ විස්තර දන්වනු ලබන අතර  සියලු නියමයන් සහ කොන්දේසි පිළිබඳව අපගේ නිලධාරීන් මගින් කලින් පැහැදිලි කරවා ගැනීමට ඔබට ආරාධනා කරන්නෙමු.<br><br>▪ මාසික වාරිකය ගෙවීමට නියමිත දින සිට දින 7 ක සහන කාලයක් ලැබෙන අතර ණය ලාභියා විසින් නියමිත දිනට හෝ සහන කාලය තුළ මාසික වාරිකය නොගෙවන්නේ නම්, 4%ක මාසික දඩ පොලියක් අදාළ වේ. මෙය කළමනාකාරීත්වයේ අභිමතය පරිදි වෙනස් කළ හැකිය. |

| ණය සේවාව | විස්තරය | ප්‍රධාන ලක්ෂණ, නියමයන් හා කොන්දේසි |
|---|---|---|
| **දේපල උකස් ණය පහසුකම්**<br><br>Vallibel PROPERTY LOAN | ▪ වැලිබල් දේපල උකස් ණය මගින් ඔබට ඔබේ දේපල උකස් කිරීම මගින් අරමුදල් සපයාගැනීමේ පහසුව සපයයි.<br><br>▪ දේපල ණය සේවාව සඳහා කැපවූ පළපුරුදු කණ්ඩායමක් හරහා අප ඔබ සඳහාම සුවිශේෂ වූ සේවාවක් සපයන්නෙමු.<br><br>▪ නිශ්චල දේපලක් මත වූ ප්‍රාථමික උකස්කරයක් අවශ්‍ය වන අතර එම දේපල වෘත්තිමය තක්සේරුකරුවකු විසින් තක්සේරු කළ යුතුය.<br><br>▪ වැලිබල් දේපල ණය පහත සඳහන් අවශ්‍යතා සඳහා ලබා ගත හැකිය;<br>- ඉඩමක් හෝ ඉඩමක් සහිත නිවසක් හෝ ගොඩනැගිල්ලක් මිලදී ගැනීමට<br>- ව්‍යාපාරයක් සඳහා අරමුදල් සපයාගැනීම සඳහා හෝ නිවසක් හෝ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා<br>- පවතින ණයක් නිදහස් කිරීමට සඳහා හෝ පියවීම සඳහා<br>- වෙනත් ඕනෑම පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා | ▪ වලංගු ජාතික හැඳුනුම්පතක් / විදේශ ගමන් බලපත්‍රයක් හිමි වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින පුද්ගලයෙක් හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ආයතනයක් යන දෙපාර්ශවයම තම ගෙවීමේ හැකියාව මත දේපල උකස් ණය පහසුකමක් සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබයි.<br>▪ උපරිම කාලසීමාව මාස 60 (වසර 5) ක් දක්වා වේ.<br>▪ සමාගම විසින් නියම කරන පරිදි ආපසු ගෙවීමේ හැකියාව සහ දේපලෙහි අනිවාර්යය විකුණුම් වටිනාකම (FSV) මත උපරිම ණය මුදල තීරණය කරනු ලැබේ.<br><br>▪ අයදුම්කරුට අයත් ඉඩමක්/නිවසක් හෝ ගොඩනැගිල්ලක් සහිත ඉඩමක් ණය මුදලෙහි සුරැකුම ලෙස සමාගමට උකසට කරනු ලැබේ. ණය කාලසීමාව අවසානයේදී සහ ණය මුදල සම්පූර්ණයෙන් පියවිමේදී උකස් බැඳුම්කරය අවලංගු කර දේපල පාරිභෝගිකයාට මුදා හරිනු ඇත.<br><br>▪ ණය පහසුකම් සඳහා අදාළ වන පොලී අනුපාත තීරණය කරනු ලබන්නේ ණය පහසුකමේ ස්වභාවය, කාල සීමාව, ලබා දී ඇති සුරැකුම, සේවාදායකයාගේ මූල්‍ය ස්ථාවරභාවය සහ වෙළඳපල තත්වයන් යනාදිය සැලකිල්ලට ගැනීමෙනි. සේවාදායකයාගේ ණය අවදානම මත ණය පහසුකමේ කාල සීමාව තුල ස්ථාවර හෝ විචල්‍ය පොලී අනුපාත අය කෙරේ. දැනට එය වසරකට 20% දක්වා පරාසයක පවතී. පවතින අදාළ පොලී ගාස්තුව, පහසුකම සලකා බැලීමට පෙර සේවාදායකයාට මුලදී දැනුම් දෙනු ලැබේ.<br><br>▪ ණය තොරතුරු කාර්යාංශ ගාස්තු - රු. 1,000/ සිට 3,000/- දක්වා, නීති ගාස්තු, ලේඛන ගාස්තු, රක්ෂණ වාරික, අදාළ රජයේ බදු (අදාළ නම්), තක්සේරු ගාස්තු (අදාළ නම්) සහ වෙනත් අදාළ ගාස්තු ණය පහසුකම් සාකච්ඡා කරන අවස්ථාවේ දී සමාගම විසින් නිශ්චිතව ප්‍රකාශ කරනු ලැබේ. සියලුම ගාස්තු ණය ගැණුම්කරු විසින් දරනු ලැබේ.<br><br>▪ වාර්ෂික පොලී අනුපාතය, ලිපිලේඛන ගාස්තු, තක්සේරු ගාස්තු, නෛතික |

| | | |
|---|---|---|
| | | ගාස්තු, මුද්දර ගාස්තු සහ ඊට සම්බන්ධ වෙනත් ගාස්තු නිශ්චිතව ණය ලබා දීමට පෙර පාරිභෝගිකයාට දැනුම් දෙනු ලැබේ.<br><br>▪ මාසික වාරිකය ගෙවීමට නියමිත දින සිට දින 6 ක සහන කාලයක් ලැබෙන අතර ණය ලාභියා විසින් නියමිත දිනට හෝ සහන කාලය තුළ මාසික වාරිකය නොගෙවන්නේ නම්, 4%ක මාසික දඩ පොලියක් අදාළ වේ. මෙය කළමනාකාරීත්වයේ අභිමතය පරිදි වෙනස් කළ හැකිය. |

| ණය සේවාව | විස්තරය | ප්‍රධාන ලක්ෂණ, නියමයන් හා කොන්දේසි |
|---|---|---|
| Vallibel AUTO Draft<br><br>**වැලිබල් ඔටෝ ඩ්‍රාෆ්ට්**<br><br>Vallibel වීල් Draft<br><br>**වැලිබල් වීල් ඩ්‍රාෆ්ට්** | ▪ බැංකු අයිරා පහසුකමකට වඩා සකසුරුවම් ලෙස සැලකෙන වැලිබල් ෆිනෑන්ස්හි සුවිශේෂී සන්නාමයක් වන වැලිබල් ඔටෝ ඩ්‍රාෆ්ට් ණය පහසුකම 2014 දී එය ආරම්භ කළ දින සිට අඛණ්ඩව වර්ධනය වෙමින් වෙළඳපල තුළ පිළිගැනීමට ලක්වී ඇත.<br><br>▪ මෙම පහසුකමේ සුවිශේෂී ලක්ෂණය වන්නේ පාරිභෝගිකයා විසින් මාසිකව පොළිය පමණක් ගෙවීමට හැකි වීමයි. මුල් මුදල ආපසු ගෙවීම, පහසුකම ලබා දෙන අවස්ථාවේදී පාරිභෝගිකයා සමඟ එකඟ වූ කාල සීමාව අවසානයේදී සිදු කරනු ලැබේ.<br><br>▪ කරදරයකින් තොරව ණය ලබා ගත හැකි වීම සහ මාසික පොලිය පමණක් ගෙවීමට හැකි වීම මෙහි ඇති පහසුවයි.<br><br>▪ වීල් ඩ්‍රාෆ්ට් වැලිබල් හි නව්‍ය ණය සැලසුමක් වන අතර එය බැංකු අයිරාවක විශේෂාංග සමඟින් ලියාපදිංචි හා ලියාපදිංචි නොකළ ත්‍රිරෝද රථ සහ මෝටර් බයිසිකල් හිමිකරුවන් ඉලක්ක කරගනිමින් සකසා ඇත. | ▪ වලංගු ජාතික හැඳුනුම්පතක් / විදේශ ගමන් බලපත්‍රයක් හිමි වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින පුද්ගලයෙක් හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ආයතනයක් යන දෙපාර්ශවයම තම ගෙවීමේ හැකියාව මත ඔටෝ ඩ්‍රාෆ්ට් ණය පහසුකමක් සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබයි.<br><br>▪ උපරිම කාලසීමාව මාස 12කි.<br><br>▪ පහසුකම් ආපසු ගෙවීමේ කාලය, ලබා දී ඇති පහසුකම්වල වටිනාකම මත රඳා පවතී.<br><br>▪ කාලපරිච්ඡේදය අවසානයේදී ණය මුදල එකවර ආපසු ගෙවීම හෝ අදාල කාලය තුළ කොටස් වශයෙන් ගෙවීම කළ හැකි අතර එසේ කොටස් වශයෙන් ගෙවීම මඟින් මාසික පොළිය අඩු කරගත හැකිය.<br><br>▪ පාරිභෝගිකයා මත කිසිදු බරක් හෝ අධික මාසික වාරිකයක් නොපැටවෙන අතර පාරිභෝගිකයාගේ අවශ්‍යතාවය මත එම මුදල තීරණය කළ හැක.<br><br>▪ ණය පහසුකම් සඳහා අදාළ වන පොලී අනුපාත තීරණය කරනු ලබන්නේ ණය පහසුකමේ ස්වභාවය, කාල සීමාව, ලබා දී ඇති සුරැකුම, සේවාදායකයාගේ මූල්‍ය ස්ථාවරභාවය සහ වෙළඳපල තත්වයන් යනාදිය සැලකිල්ලට ගැනීමෙනි. සේවාදායකයාගේ ණය අවදානම මත ණය පහසුකමේ කාල සීමාව තුල ස්ථාවර හෝ විචල්‍ය පොලී අනුපාත අය කෙරේ. දැනට වැලිබල් ඔටෝ ඩ්‍රාෆ්ට් පොලී අනුපාතය වසරකට 21%-23% දක්වා පරාසයක පවතී. පවතින අදාළ පොලී ගාස්තුව, පහසුකම සලකා බැලීමට පෙර සේවාදායකයාට මුලදී දැනුම් දෙනු ලැබේ.<br><br>▪ ණය තොරතුරු කාර්යාංශ ගාස්තු - රු. 1,000/ සිට 3,000/- දක්වා, මෝටර් රථ ලියාපදිංචි ගාස්තු රු. 2,000/- සිට 2,500/- දක්වා, ලේඛන ගාස්තු, රක්ෂණ වාරික, අදාළ රජයේ බදු (අදාළ නම්), තක්සේරු ගාස්තු (අදාළ නම්) සහ වෙනත් අදාළ ගාස්තු ණය පහසුකම් සාකච්ඡා කරන අවස්ථාවේ දී සමාගම විසින් නිශ්චිතව ප්‍රකාශ කරනු ලැබේ. සියලුම ගාස්තු ණය ගැණුම්කරු විසින් දරනු ලැබේ. |

vallibel Finance

| | | |
|---|---|---|
| | | ▪ වාහනය සහ පුද්ගල ඇපකරුවන් මෙහි සුරැකුම වේ.<br>▪ පවත්නා පොලී අනුපාත පිළිබඳව පහසුකම සලකා බැලීමට පෙර සේවාදායකයාට මුලින්ම දැනුම් දෙනු ලැබේ.<br>▪ මාසික වාරිකය ගෙවීමට නියමිත දින සිට දින 4 ක සහන කාලයක් ලැබෙන අතර ණය ලාභියා විසින් නියමිත දිනට හෝ සහන කාලය තුළ මාසික වාරිකය නොගෙවන්නේ නම්, 4.25%ක මාසික දඩ පොලියක් අදාළ වේ. මෙය කළමනාකාරීත්වයේ අභිමතය පරිදි වෙනස් කළ හැකිය.<br> |

| ණය සේවාව | විස්තරය | ප්‍රධාන ලක්ෂණ, නියමයන් හා කොන්දේසි |
| --- | --- | --- |
| **වාහන ණය / පුද්ගල ණය** | ▪ මෙම පහසුකම පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා මෙන්ම වඩාත් වේගවත්ව හා පහසුවෙන් ලබාදීමට හැකි ආකාරයකින් සකස් කර ඇත.<br><br>▪ මෙම ණය මුදල ප්‍රධාන වශයෙන් මෝටර් කාර්, වෑන්, SUV රථ සඳහා ලබාදෙනු ලැබේ. | ▪ වලංගු ජාතික හැඳුනුම්පතක් / විදේශ ගමන් බලපත්‍රයක් හිමි වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින පුද්ගලයෙක් හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ආයතනයක් යන දෙපාර්ශවයම තම ගෙවීමේ හැකියාව මත වාහන/පුද්ගල ණය පහසුකමක් සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබයි.<br><br>▪ උපරිම කාලසීමාව මාස 72 (වසර 6) ක් දක්වා ලබා දේ.<br><br>▪ පහසුකම් සඳහා සුරැකුම් ලෙස දේපල පිළිබඳ මූල්‍ය අයිතිය සහ පුද්ගලික ඇපකරුවන් (අවශ්‍ය නම්) අදාල වේ.<br><br>▪ ණය පහසුකම් සඳහා අදාළ වන පොලී අනුපාත තීරණය කරනු ලබන්නේ ණය පහසුකමේ ස්වභාවය, කාල සීමාව, ලබා දී ඇති සුරැකුම, සේවාදායකයාගේ මූල්‍ය ස්ථාවරභාවය සහ වෙළඳපල තත්වයන් යනාදිය සැලකිල්ලට ගැනීමෙනි. සේවාදායකයාගේ ණය අවදානම මත ණය පහසුකමේ කාල සීමාව තුල ස්ථාවර හෝ විචල්‍ය පොලී අනුපාත අය කෙරේ. දැනට එය වසරකට 18%-23% දක්වා පරාසයක පවතී. පවතින අදාළ පොලී ගාස්තුව, පහසුකම සලකා බැලීමට පෙර සේවාදායකයාට මුලදී දැනුම් දෙනු ලැබේ.<br><br>▪ ණය තොරතුරු කාර්යාංශ ගාස්තු - රු. 1,000/ සිට 3,000/- දක්වා, මෝටර් රථ ලියාපදිංචි ගාස්තු - රු. 2,000/- සිට ,2500/- දක්වා, ලේඛන ගාස්තු, රක්ෂණ වාරික, අදාළ රජයේ බදු (අදාළ නම්), තක්සේරු ගාස්තු (අදාළ නම්) සහ වෙනත් අදාළ ගාස්තු ණය පහසුකම් සාකච්ඡා කරන අවස්ථාවේ දී සමාගම විසින් නිශ්චිතව ප්‍රකාශ කරනු ලැබේ. සියලුම ගාස්තු ණය ගැණුම්කරු විසින් දරනු ලැබේ.<br><br>▪ මාසික වාරිකය ගෙවීමට නියමිත දින සිට දින 6 ක සහන කාලයක් ලැබෙන අතර ණය ලාභියා විසින් නියමිත දිනට හෝ සහන කාලය තුළ |

| | | |
|---|---|---|
| | | මාසික වාරිකය නොගෙවන්නේ නම්, 4%ක මාසික දඩ පොලීයක් අදාළ වේ. මෙය කළමනාකාරීත්වයේ අභිමතය පරිදි වෙනස් කළ හැකිය. |

| ණය සේවාව | විස්තරය | ප්‍රධාන ලක්ෂණ, නියමයන් හා කොන්දේසි |
| --- | --- | --- |
| **රන් ණය** | ▪ වැලිබල් ෆිනෑන්ස් මගින් රන් භාණ්ඩ මත ක්ෂණික ණය ලබා ගැනීම සඳහා සිය ගණුදෙනුකරුවන්ට රන් ණය පහසුකම ලබා දෙයි.<br><br>▪ රන් ණය වෙළඳපොලේ තරඟකාරී පොලී අනුපාත යටතේ අත්තිකාරම ලබා ගන්නා දිනයේ රත්‍රන්වල වටිනාකම මත අපි ඔබට ඉහළම අත්තිකාරම් ලබා දෙන්නෙමු.<br><br>▪ ඔබේ පහසුව පරිදි වාරික වශයෙන් ආපසු ගෙවීම් කළ හැකිය.<br><br>▪ එක් රන් භාණ්ඩයකට වඩා වැඩි ගණනක් උකස් කර ඇති විටක ඔබට අවශ්‍ය නම් එක් භාණ්ඩයක් පමණක් නිදහස් කරගත හැකිය.<br><br>▪ විශ්වාසනීය විශිෂ්ටත්වයක් සමග ඉහළම ආරක්ෂාව සහ ඔබගේ වටිනා රන් භාණ්ඩ සඳහා 100% ක් නොමිලේ රක්ෂණ ආවරණයක්. | ▪ අයදුම්කරුවන් වලංගු අනන්‍යතාවයක් ඇති වයස අවුරුදු 18 ට වැඩි පුරවැසියන් හා ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන් විය යුතුය.<br><br>▪ සේවාව ලබා ගැනීම සඳහා වලංගු ජාතික හැඳුනුම්පතක් (ජාතික හැඳුනුම්පතක්) / රියදුරු බලපත්‍රයක් / විදේශ ගමන් බලපත්‍රයක් ඉදිරිපත් කල යුතුය.<br><br>▪ අවම අත්තිකාරම් මුදල රු.1,000/-<br><br>▪ මාස 1, 3, 6, 9 සහ 12 දක්වා පහසුකම් කාලසීමාව.<br><br>▪ උකස් කල රන් භාණ්ඩවල වටිනාකම මත පදනම් වන අත්තිකාරම් මුදල.<br><br>▪ පවත්නා පොලී අනුපාත පිළිබඳව සේවාදායකයාට ආරම්භයේදීම දැනුම් දෙනු ලැබේ. දැනට එය වසරකට 15%-21% දක්වා පරාසයක පවතී.<br><br>▪ සේවා ගාස්තු, අදාළ නම්, ණය ගැණුම්කරු විසින් දරනු ලැබේ.<br><br>▪ ණය මුදල සඳහා වන පොලී අනුපාතය ස්ථාවර පොලී අනුපාතයක් වන අතර ණය ලබා දෙන අවස්ථාවේ දී ලබා දෙන රන් ණය ටිකට් පත්‍රයේ එම අගය සඳහන් වේ. පළමු දින දහය සඳහා 1% ක පොළියක් අය කෙරෙන අතර ඉන් පසුව අදාළ පොලී අනුපාතය දෛනිකව අය කෙරේ.<br><br>▪ නියමිත දිනට රන් භාණ්ඩය මුදා නොගන්නේ නම් හෝ අලුත් නොකළේ නම්, හිඟ මුදල මත මසකට 0.5% ක කල් ඉකුත් පොලී අනුපාතයක් අය කෙරේ.<br><br>▪ අදාල කාල සීමාව තුළ ඕනෑම අවස්ථාවක රන් භාණ්ඩ නිදහස් කර ගැනීමට හෝ ගිවිසුම අළුත් කිරීමට ණය ගැනුම්කරුට නිදහස ඇත. නිදහස් කර ගැනීමේදී හෝ ගිවිසුම අළුත් කිරීමේදී ණය ගැනුම්කරුගේ අනන්‍යතාවය |

| | | |
|---|---|---|
| | | තහවුරු කළ යුතුය.<br><br>▪ 1949 අංක 6 දරණ උකස් පනත ප්‍රකාරව ණය ගැනුම්කරු විසින් උකස් කර ඇති භාණ්ඩ සඳහා උකස් බැඳුම්කරයකට අත්සන් කළ යුතුය.<br><br>▪ අලුත් කිරීමේදී, පාරිභෝගිකයාට මුදල් ගෙවූ රිසිට්පතක් නිකුත් කරනු ලැබේ..<br><br>▪ භාණ්ඩ නිදහස් කර ගැනීම සඳහා අප වෙත පෙර දැනුම් දීමක් කරන ලෙස පාරිභෝගිකයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.<br><br>▪ නිදහස් කර ගැනීමේදී රන් භාණ්ඩ සමඟ මුදල් ගෙවූ කුවිතාන්සිය පාරිභෝගිකයාට නිකුත් කෙරේ.<br><br>▪ උකස් පනතේ දක්වා ඇති රෙගුලාසි වලට අනුකූලව, මුදවා නොගත් හෝ අළුත් නොකරන ලද රන් ණය භාණ්ඩ ගණුදෙනුකරුට දැනුම් දීමෙන් පසු වෙන්දේසි කරනු ලැබේ |

## පහසුකමක්/සේවාවක් ලබා ගැනීම සඳහා අනුගමනය කලයුතු ක්‍රියාපටිපාටිය

- වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී වෙතින් පහසුකමක්/සේවාවක් ලබා ගැනීමට අපේක්ෂා කරන පාරිභෝගික භවතුන්ට අප වෙත පැමිණීමට හෝ ළඟම ඇති ශාඛාව ඇමතීමට ඇරයුම් කර සිටිමු. ශාඛා ලැයිස්තුව, ඒවායේ පිහිටීම සහ ඇමතුම් අංක අපගේ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය සඳහන් වේ. https://www.vallibelfinance.com/branch
- අවශ්‍ය තොරතුරු ලබා දීමෙන් සහ ඔබේ අවශ්‍යතා සපුරාගැනීමට මගපෙන්වීමෙන් අපගේ නිලධාරීන් ඔබට සහයවනු ඇත.
- සාකච්ඡාවෙන් පසු ණය ලබාගැනීමට බලාපොරොත්තු වන්නා සහ සමාගමේ නියෝජිතයා ණය පහසුකම්වල නියමයන් හා කොන්දේසි සාකච්ඡා කරනු ඇත. සාකච්ඡා ක්‍රියාවලිය තුලදී පොලී අනුපාත සහ වෙනත් නියමයන් හා කොන්දේසි පිළිබඳ සියලු තොරතුරු අපගේ සමාගම් නියෝජිතයාගෙන් ලබා ගැනීමට ඔබව දිරිමත් කරනු ලැබේ.
- ණය ඉල්ලීම ඇගැයිම් කිරීම හා සැකසීම ඉදිරියට ගෙන යාම සඳහා ගනුදෙනුකරු විසින්ණය ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කර අදාළ ලියකියවිලි සමඟ අප වෙත ලබා දිය යුතුය.
- ණය ඇගයීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස සමාගමේ බලයලත් නිලධාරියෙකු විසින් අදාල වාහනය/දේපළ, ව්‍යාපාර සහ නේවාසික පරිශ්‍රයන් පිළිබඳ පරීක්ෂණයක් සිදු කරනු ලැබේ.
- මූලිකව සාකච්ඡා කරන ලද නියමයන් සහ කොන්දේසි අනුමත කිරීමේ අදියරේදී සංශෝධනය විය හැකි අතර ඒ පිළිබඳව ණය පහසුකම ප්‍රදානය ක්රීමට පෙර සමාගම විසින් අයදුම්කරුට දන්වනු ලැබේ.
- සමාගමේ අවශ්‍යතා අනුව සියලුම ලියකියවිලි ඉදිරිපත් කර ඇත්නම් නම් අවම කාල සීමාවක් තුළදී ණය ලබා දෙනු ලැබේ.
- අවශ්‍ය සියලු ලියකියවිලි සම්පූර්ණ කිරීමට සහ සමාගමේ ණය ඇගයීමේ නිර්ණායකයන්ට යටත්ව සියලු ණය පහසුකම් ලබාදීම් සමාගමේ පූර්ණ අභිමතය පරිදි සිදුකෙරේ.

## අදාළ වන නීතිමය විධිවිධානයන්

2000 අංක 56 දරණ කල්බදු සමාගම් පනත, 1990 අංක 03 දරණ උකස් පනත මඟින් සංශෝධිත 1949 අංක 06 දරණ උකස් පනත, 1990 අංක 14 දරණ දේශීය භාර ලදුපත් පනත, ගිවිසුම් කඩ කිරීමේ නීතිය, සිවිල් නඩු විධිවිධාන සංග්‍රහය සහ ශ්‍රී ලංකාවේ අදාළ වෙනත් නීති ආදිය මගින් මෙම ණය පහසුකම් නියාමනය කෙරෙනු ඇත.

## ආපසු අයකරගැනීමේ විධිවිධානයන්

ණය ගිවිසුමේ කාලසීමාවට අනුව, ණය මුදල වාරික වශයෙන් අයකර ගනු ඇත. අක්‍රමවත් ගෙවීම් සම්බන්ධයෙන් වන විට, එක් එක් අවස්ථාවට අදාලව සමාගම විසින් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ඇත. ආපසු ගෙවීම් විධිමත් කිරීම දිරිගැන්වීම සඳහා අඛණ්ඩ සිහිකැදවීමේ ඇමතුම්, පාරිභෝගික හමුවීම්, සිහිකැදවීමේ ලිපි යනාදිය භාවිතා කරනු ලැබේ. ගනුදෙනුකරුවන් හට ණය පහසුකම් ආපසු ගෙවීමට අවශ්‍ය සෑම පහසුකමක්ම සැලසීමට සමාගම සැමවිටම උත්සහ ගනී.

vallibel Finance

අදාළ ණය පහසුකම නිසි පරිදි පියවීමට පාරිභෝගිකයාට තවදුරටත් නොහැකි නම්, වැලිබල් ෆිනෑන්ස් විසින් තම ගිවිසුම්ගත අයිතිවාසිකම් සහ අදාළ නීතිරීතිවලට අනුකූලව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කරනු ඇත. ගිවිසුම කඩවීමේ ප්‍රතිඵලයක් ලෙස අපගේ ණය අයකරගැනීමේ නිලධාරීන් යෙදවීමට අපට සිදුවන්නේ නම්, එවැනි ගමන් සඳහා වන පිරිවැය අයකරගැනීම සඳහා ගිවිසුමට ඇතුලත් කෙරේ. මෙසේ ණය අයකරගැනීම සඳහා සමාගම විසින් දරනු ලබන සියලුම නෛතික හා වෙනත් වියදම් පාරිභෝගිකයා විසින් දැරිය යුතුය.

## පාරිභෝගික තොරතුරු අනාවරණය කිරීම

2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනතේ 61 (2) වගන්තියේ විධිවිධානවලට අනුව ගනුදෙනුකරු සමඟ කෙරෙන සියලුම ගනුදෙනු සම්බන්ධයෙන් අපි දැඩි රහස්‍යභාවය රැකගැනීමට කටයුතු කරන්නෙමු.

වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන අතර පාරිභෝගිකයාට පූර්ව දැනුම් දීමකින් තොරව හා පාරිභෝගිකයා වෙත අමතර බැඳීම් සහ නීතිමය උපදෙස් ලබාගැනීමකින් තොරව පාරිභෝගික ගනුදෙනු පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවට සහ අනෙකුත් නියාමන / ව්‍යවස්ථාපිත ආයතනවලට ලබා දීමට බැඳී සිටී.

ණය ගැනුම්කරුවන්ගේ විස්තර ඇතුළු ණය තොරතුරු ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයට වාර්තා කිරීමට සමාගම බැඳී සිටී.

## 2006 අංක 6 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත

කිසියම් ගනුදෙනුවක් හෝ ගනුදෙනුවකට උත්සාහ කිරීමක් කිසියම් නීති විරෝධී කටයුත්තකට හෝ සාපරාධී වරදකට සම්බන්ධ බවට සැක කිරීමට සමාගමට සාධාරණ හේතු තිබේ නම්, එවැනි ගනුදෙනු 2006 අංක 6 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනතේ 7 වන වගන්තියේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි අංශයට වාර්තා කරනු ලැබේ.

## පැමිණිලි මෙහෙයුම් ක්‍රියා පටිපාටිය

අපගේ සේවාවන් සම්බන්ධයෙන් වන පැමිණිලි ඔබට පහත පරිදි සිදුකළ හැකිය;

1. +94 11 7 480 480 අංකය ඔස්සේ ඇමතුම් මධ්‍යස්ථානය හා සම්බන්ධ වීමෙන්
2. tellus@vallibelfinance.com යන විද්‍යුත් ලිපිනය මගින්
3. වැලිබල් ෆිනෑන්ස්, අංක 310, ගාලු පාර, කොළඹ 03 ලිපිනයට ලිඛිතව දැන්වීමෙන්

vallibel Finance

4. www.vallibelfinance.com යන අපගේ වෙබ් අඩවියේ ‘Contact Us’ තුලින් පණිවුඩයක් එවීමෙන්

සමාගම විසින් සතුටුදායක විසඳුමක් ලබා නොදුනහොත්, පාරිභෝගිකයාට ඔහුගේ / ඇයගේ පැමිණිල්ල ශ්‍රී ලංකාවේ මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලයට ඉදිරිපත් කළ හැකිය.

මූල්‍ය ඔම්බුඩ්ස්මන්
මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය
143A, වජිර පාර,
කොළඹ 05.
අමතුම් අංකය: +94 11 259 5624
දුර/ෆැක්ස්: +94 11 259 5625 විද්‍යුත් ලිපිනය: fosril@sltnet.lk
වෙබ් අඩවිය: www.financialombudsman.lk

පහසුකම්/සේවාවන්හි විශේෂාංග තේරුම් ගැනීමට ඔබට උපකාර කිරීම සඳහා වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී විසින් සපයනු ලබන මෙම ප්‍රධාන කරුණු ලේඛනය පහසුකම් සහ සේවාවන්හි ප්‍රධාන අංගයන්ගෙන් සමන්විත වේ.
ඉහත සඳහන් ඕනෑම නියමයන්, කොන්දේසි සහ ගාස්තු ඕනෑම වේලාවක සමාගමේ අභිමතය පරිදි සංශෝධනය කිරීමේ පූර්ණ අයිතිය සමාගම සතුය.